සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# ඉතිහාසය

**09 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ජොරිස් වැන් ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතික අද්මිරාල්වරයා නැව් තුනක් සමඟ ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි ...................................................... වරායට ගොඩබැස්සේය. ( ත්‍රිකුණාමලය / මඩකලපුව / ගොඩවාය )

02 පස්වන විලියම් රජතුමා විසින් එංගලන්තයේ කිව් මාළිගයේ සිට ලියූ ලිපිය ශ්‍රී ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාර ................................................... වෙත එවන ලදී. ( ෆන් එංගල්බෙග් / රොබට් බ්‍රවුන්රිග් / ස්ටුවට් මැකන්සි )

03 වසර 30 ක් තිස්සේ නොකඩවා බුක්ති විඳි බවට අධිකරණය ඉදිරියේ තහවුරු කළ නොහැකි වූ ඉඩම් ................................................... පනත යටතේ රජයට පවරා ගන්නා ලදී. ( සුරාබදු පනත / මුඩුබිම් පනත / අඳගොවි පනත )

04 මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් පවත්වන ලද වාද විවාද අතරින් ................................................... ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්විය. (බද්දේගම වාදය / පානදුරාවාදය / උදම්විට වාදය )

05 ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණෙන විට ................................................... එහි බලවත්ව පැවතුනි. (මූගල් අධිරාජ්‍යය / විජය නගර් අධිරාජ්‍යය / අශෝක අධිරාජ්‍යය )

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රකාශයන් නිවැරදි නම් වරහන් තුළ (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

06 දෙවන රාජසිංහ රජුගේ අවධියේ දී ජෙනරාල් ජෙරාඩ් හල්ප්ට් නම් ලන්දේසි ජාතිකයා ලංකාවට පැමිණෙන ලදී. ( )

07 කැප්පෙටිපොළ නිලමේ තුමා ක්‍රි.ව. 1848 නිදහස් අරගලයට නායකත්වය දුන් පුද්ගලයෙකි. ( )

08 මිෂනාරීන් සිය ආගම ප්‍රචාරය සඳහා "උරගල" නම් ප්‍රකාශනයක් නිකුත් කරන ලදී. ( )

09 පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමියන්ගේ මූලිකත්වයෙන් මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවන ලදී.

( )

10 ඉන්දියාවේ වෙරළබඩ ප්‍රදේශයේ බලය අල්ලාගත් ප්‍රංශ ජාතිකයින් පොන්ඩිචෙරි ප්‍රදේශය මූලික කරගෙන පාලන කටයුතු මෙහෙය වීය. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර පහත සඳහන් පිළිතුරු අතරින් තෝරන්න.**

11 ලන්දේසි අධිකරණ පද්ධතියේ ඉහළම උසාවිය වූයේ මින් කුමක් ද?

(1) රාද්වැන් ජස්ටිට් (2) සිවිල්රාද් (3) ලැන්රාද් (4) පිස්කල් උසාවිය

12 ලන්දේසීන් විසින් ඔවුන්ගේ භාෂාවෙන් උසස් අධ්‍යාපනය ලබාදීම සඳහා පිහිට වූ සෙමනේරිය නම් ආයතනය පිහිටි ප්‍රදේශය වන්නේ මින් කුමක් ද?

(1) ගාල්ල (2) කොළඹ (3) මීගමුව (4) හලාවත

13 හියුබොයිඩ් නම් ඉංග්‍රීසි ජාතිකයාගේ දූත ගමන සිදුවන අවධියේ සිටි උඩරට පාලකයා කවුරුන් ද?

(1) කීර්ති ශ්‍රී රාජසිංහ (2) ශ්‍රී වික්‍රම රාජසිංහ (3) රාජාධිරාජසිංහ (4) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ

14 හෙමිලියා වෙස්ට්‍රාටික්ස් නම් දිලීර රෝගය වැළඳීම නිසා විනාශයට පත් වතු වගාව මින් කුමක් ද?

(1) තේ (2) කොකෝවා (3) සිංකෝනා (4) කෝපි

15 ඉන්දියාව තුල සික් ජනතාව අතර සංස්කෘතික ප්‍රබෝධය ඇති කිරීම සඳහා ආරම්භ කළ සංවිධානය වන්නේ මින් කුමක් ද?

(1) බ්‍රහ්ම සමාජය (2) අහමඩියා (3) ආර්ය සමාජය (4) සිංසභා

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර ලියා දක්වන්න.**

16 ක්‍රි.ව. 1818 නිදහස් අරගලයට බල පෑ ආසන්න හේතුව වූයේ ඌව වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් තනතුරට ............................................................ නම් මුස්ලිම් ජාතිකයා පත්කිරීමයි.

17 තේ වගාව පිළිබඳ මුලින්ම ලංකාව තුළ අත්හදා බැලීම් කළේ ..................................................................... නැමැත්තා විසිනි.

18 වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා අනුරපුරයේ නටඹුන් වූ ................................................... රැක ගැනීමේ ව්‍යාපාරය සංවිධානය කළේය.


19 ඩබ්ලිව් සී. බෙනර්ජී මහතා ඉන්දියානු ජාතික සංගමයේ ........................................................... ධූරයට පත්විය.

20 බ්‍රිතාන්‍ය නිෂ්පාදන වර්ජනය කර ඉන්දියානු නිෂ්පාදන භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපාරය ............................................................................ ව්‍යාපාරය නමින් හැඳින්වේ. (ල. 20 × 2 = 40)

# ඉතිහාසය - II කොටස


- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිතියම් කොටස උපයෝගී කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(i) ප්‍රංශ ජාතිකයන්ගේ පෙරදිග මධ්‍යස්ථානයක් වන කරිකාල් දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

(ii) සිපොයි කැරැල්ල ව්‍යාප්ත වූ ප්‍රදේශයක් වන දිල්ලිය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)




(iii) ක්‍රි.ව. 1818 නිදහස් අරගලය ආරම්භ වූ ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)


(iv) ක්‍රි.ව. 1848 නිදහස් අරගලය ආරම්භ වූ ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

(v) පින්තූරයේ දැක්වෙන්නේ ලංකාවේ ක්‍රියාත්මක වූ මිෂනාරි සමාගමක් විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ලකි. එය කුමක් ද? (ල. 02)



(vi) එය ඉදිකළ මිෂනාරි සමාගම නම් කරන්න. (ල. 02)

(vii) පින්තූරයේ දැක්වෙන තැනැත්තා කවුරුන් ද? (ල. 02)



(viii) (අ) එතුමා ආරම්භ කළ පුවත්පත කුමක් ද? (ල. 01)

(ආ) ඉස්ලාම් දහමට අනුගත අධ්‍යාපනයක් ලබා දීම සඳහා ඔහු ආරම්භ කළ පාසල කුමක් ද? (ල. 01)

02 (i) ලංකාවේ ලන්දේසීන් යටතේ පැවති පාලන කොට්ඨාස 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) ලන්දේසීන්ට, පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම පිහිටුවීමේ රාජ්‍යය බලපත්‍රය ලබාදුන් පසු එම සමාගමට ලැබුණ බලතල 04ක් නම් කරන්න. (ල. 04)

(iii) පහත සඳහන් ප්‍රකාශවලට සම්බන්ධ රජවරුන්ගේ නම් එම ප්‍රකාශ ඉදිරියෙන් ලියන්න.

- ක්‍රි.ව. 1638 ගිවිසුම අත්සන් කිරීම
- පහළ බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වීමට ලන්දේසීන් ගෙන් නැව් ලබා ගැනීම
- සියම් නිකාය ආරම්භ කිරීම
- ඉංග්‍රීසින් ලංකාවට පැමිණීම (ල. 04)

03 (i) වෙළඳාම සම්බන්ධයෙන් ඉංග්‍රීසින් ලංකාව අල්ලා ගැනීමට හේතු වූ කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(ii) පහත සඳහන් ස්ථාන අතරින් ක්‍රි.ව. 1796 පෙබරවාරි මාසය වන විට ඉංග්‍රීසින් විසින් ලන්දේසීන්ගෙන් අල්ලාගත් බලකොටු 04 ක් තෝරා ලියන්න. (යාපනය, වව්නියාව, මන්නාරම, කිලිනොච්චිය, කල්පිටිය, කොළඹ, ගාල්ල) (ල. 04)

(iii) ඉංග්‍රීසින්ගේ ක්‍රි.ව. 1803 උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු 02 ක් හා ක්‍රි.ව. 1815 උඩරට ආක්‍රමණය සාර්ථක වීමට බලපෑ හේතු 02 ක් නම් කරන්න. (ල. 04)

04 (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට පරිපාලන වියදම් අවම කරගැනීමේ අරමුණින් කෝල්බෲක් කොමිසම විසින් ලබාදුන් යෝජනා 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) බ්‍රිතාන්‍යයන් දේශීය කෘෂිකර්මය නගා සිටුවීම සඳහා ගන්නා ලද එක් ක්‍රියාමාර්ගයක් ලෙස සමුපකාර සමිති ව්‍යාපාරය පිහිටුවීම දැක්විය හැකිය. එලෙස සමුපකාර ව්‍යාපාරය මගින් බලාපොරොත්තු වූ අරමුණු 04 ක් දක්වන්න. (ල. 04)

(iii) පහත සඳහන් වන්නේ බ්‍රිතාන්‍යයන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමට උත්සාහ දැරූ අවස්ථා කීපයකි. එම අවස්ථා සඳහා දායක වූ ආණ්ඩුකාරවරුන් දක්වන්න.

A වාරිකර්මාන්ත පිළිබඳ සොයා බැලීම සඳහා 1855 කාරක සභාවන් පත් කිරීම

B වාරිමාර්ග පිළිබඳ සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කිරීම

C අනුරපුර බසවක්කුලම වැව ප්‍රතිසංස්කරණය කිරීම

D වලවේ ගඟ හා උඩුකිරිවල ආශ්‍රිත වාරිකර්මාන්ත ප්‍රතිසංස්කරණය කිරීම (ල. 04)

05 පහත සඳහන් වචන සටහන උදව් කරගෙන දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සඳහා ක්‍රියාත්මක වූ ස්වේච්ඡා සංවිධාන 03 ක් තෝරා ලියන්න. (ල. 03)

(ii) ආගම ප්‍රචාරයට මිෂනාරි සමාගම් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග 04 ක් සොයා ලියන්න. (ල. 04)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප | ල | න් | ඩ | න් | ච | ර් | ව් |
| ර | අ | දේ | ශ | න | ය | න් | ස |
| ම | ධ | ලේ | බැ | ප් | ටි | ස් | මා |
| වි | යා | බ | වි | ද්‍යෝ | ද | ය | ඡ |
| ඥ | ප | න | ස් | ක | න් | ධ | සේ |
| නා | න | ය | පු | රා | ණ | ම් | වා |
| ර් | ය | වි | ද්‍යා | ල | ං | කා | ර |
| ඨ | ධ | ර් | ම | පා | ල | තු | මා |
| ඔ | ර | බි | පා | ෂා | ස | ග | රා |

(iii) පහත ප්‍රකාශ වලට අදාළ වන පිළිතුරු වචන වගුවෙන් තෝරා ලියන්න.

(අ) ඕල්කොට් තුමා මුල් වී පිහිට වූ සමාගම කුමක් ද?

(ආ) හික්කඩුවේ සුමංගල හිමි පිහිට වූ පිරිවෙන කුමක් ද?

(ඇ) හින්දු ආගමික පුනරුදයේ දී දෙමළ භාෂාවට පරිවර්තනය කළ ග්‍රන්ථයක් ලියන්න.

(ඈ) සිද්ධි ලෙබ්බෙ මහතාට ඉස්ලාම් ආගමික පුනරුදයේදී උදව් කළ ඊජිප්තුවෙන් පිටුවහල් කළ තැනැත්තා කවුද? (ල. 04)

06 (i) පහත සඳහන් වන්නේ ඉන්දියාව තුළ යුරෝපීයන් බලය ව්‍යාප්ත කළ ප්‍රදේශ කීපයකි. ඒ එක් එක් ප්‍රදේශ වල බලය පිහිටුවාගත් යුරෝපා ජාතීන් නම් කරන්න.

A - ගෝව .

B - ඔරිස්සා .

C - චන්ද්‍රනගර් . (ල. 03)

(ii) පහතින් සඳහන් වන්නේ ඉන්දියාවේ මුගල් අධිරාජ්‍යයේ පාලකයන් විසින් සිදු කරන ලද කාර්යයන් කීපයකි. එම කාර්යයන් කරන ලද පාලකයන් වරහන් තුළින් තෝරා ලියන්න.

A - 1526 උතුරු ඉන්දියානු ප්‍රදේශ කීපයක් අල්ලාගෙන වෙනම පාලනයක් ගොඩනැගිම

B - මුගල් බලය අධිරාජ්‍ය තත්වයට ව්‍යාප්ත කිරීම

C - සුප්‍රකට ටජ්මහල් නම් නිර්මාණය ඉදිකිරීම

D - මූගල් අධිරාජ්‍යයේ පරිහානිය සිදු වීම

( මහා අක්බාර් / බාබූර් / ජහන්ගීර් / ඖරංෂෙබ් / සාජහාන් ) (ල. 04)

(iii) පහත සඳහන් වන්නේ ඉංග්‍රීසින් ඉන්දියාවේ බල ව්‍යාප්තියෙ සඳහා යුධ උපක්‍රම වලට අමතරව යෙදූ උපක්‍රම කීපයකි. එම උපක්‍රම උදව් කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| යෙදූ උපක්‍රමය | ක්‍රියාත්මක වූ ආකාරය | අල්ලාගත් ප්‍රදේශ |
|---|---|---|
| (1) .................................. | අභ්‍යන්තර බල අරගල හා වියවුල් සහිත ප්‍රදේශ සමග ගිවිසුම් ඇතිකර ගෙන ගිවිසුමේ ලෙස මුදල් ගෙවීමට නොහැකි වූ ප්‍රදේශ ඉංග්‍රීසින් විසින් පවරා ගැනීම. | (2) .................................. |
| අස්වාමික න්‍යාය | (3) .................................................................................. | (4) .................................. |

(ල. 04)

07 (i) පහතින් නම් සඳහන් වන පුද්ගලයින් දැක්වෙන පින්තූර A, B, C ලෙස දක්වා ඇත. පින්තූරයට අදාළ ඉංග්‍රීසි අක්ෂර පින්තූරයේ සිටින තැනැත්තාට අදාළ නම ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.


★ බාල් ගංගාධාර් තිලක් ( )

A



★ දඩාබායි නඖරෝජි ( )

B



★ සුරේන්ද්‍රනාත් බැනර්ජි ( )

C



(ල. 03)

(ii) ඉන්දියානුවන්ට පාලන කටයුතු වලට සහභාගි වීමට ඇති ඉඩකඩ පුළුල් වන ආකාරයට, ඉන්දියානු ජාතික සංගමයේ මුල්කාලීන ඉල්ලීම් සකස්වී තිබුණි. එවැනි ඉල්ලීම් 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) ඉන්දියානු ජාතික සංගමය මධ්‍යස්ථ මතධාරීන්ගේ ක්‍රියාකාරිත්වය යටතේ පැවති කාලයේ ඔවුන්ගේ ඉල්ලීම් දිනා ගැනීමට අනුගමනය කළ ක්‍රියා මාර්ග 04 ක් දක්වන්න. (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. මඩකලපුව 02. ෆන් එංගල්බෙග් 03. මුඩුබිම් පනත 04. පානදුරාවාදය 05. මූගල් අධිරාජ්‍යය
06. (✓) 07. (✗) 08. (✓) 09. (✗) 10. (✓) 11. (1) 12. (2) 13. (3) 14. (4) 15. (4)
16. හජ්ජි මරික්කාර් 17. ජේම්ස් ටේලර් 18. බෞද්ධ විහාරස්ථාන 19. ප්‍රථම සභාපති 20. ස්වදේශීය

(2 x 20 = ල. 40)

## II කොටස

01. (i) - A (ii) - B (iii) - A (iv) B
(v) - ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය (vi) - වෙස්ලියන් (vii) - එම්. සී. සිද්දිලෙබ්බෙ
(viii) - (අ) මුස්ලිම් නේෂන් (ආ) කොළඹ සහිරා විද්‍යාලය (ල. 2 × 8 = 16)

02. (i) ● කොළඹ කමාන්ඩරිය ● ගාලු කමාන්ඩරිය ● යාපන කමාන්ඩරිය (ල. 03)
(ii) ● ආසියාවේ වෙළඳාම කිරීමට ● ප්‍රදේශ යටත් කිරීමට ● බලකොටු ඉදිකිරීම ● ආණ්ඩුකාරවරු පත් කිරීම (ල. 04)
(iii) ★ II රාජසිංහ ★ 2 වන විමලධර්මසූරිය ★ කීර්ති ශ්‍රී රාජසිංහ ★ රාජාධිරාජසිංහ (ල. 04)

03. (i)
★ ඉතා උසස් තත්වයේ කුරුඳු ලබාගත හැකිවීම
★ කුළුබඩු හැරුණු විට අලි ඇතුන් මුතු මැණික් ලබාගත හැකි විම
★ බ්‍රිතාන්‍යයන් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ මෙරට දී අලෙවි කිරීමට වෙළඳපලක් නිර්මාණය කරගත හැකි වීම (ල. 03)

(ii) යාපනය, මන්නාරම, කල්පිටිය, කොළඹ (ල. 04)

(iii) 1803 ආක්‍රමණය අසාර්ථක වීමට හේතු
★ වර්ෂා කාලය එළඹීම ★ කොළඹ මහනුවර අතර සබඳතා බිඳවැටීම
★ ඉංග්‍රීසි හමුදාවට යුධ උපකරණ නොලැබීම ★ ආහාර නොලැබීම
★ ජනතාව රජුට පක්ෂපාති වීම

1815 ආක්‍රමණය සාර්ථක වීමට හේතු ජෝන් ඩොයිලිගේ උපායශීලී ක්‍රියා කලාපය
රජු සමග රදලයන්, භික්ෂූන් වහන්සේලා , සාමාන්‍ය ජනතාව ආදීන් අමනාප වීම (ල. 04)

04. (i)
● ඇතැම් දෙපාර්තමේන්තු වසා දැමීම හා ඇතැම් ඒවා ඒකාබද්ධ කිරීම
● සිවිල් සේවයේ සංඛ්‍යාව අඩු කිරීම හා ඔවුන්ගේ වැටුප් අඩු කිරීම
● උඩරට පහතරට ඒකාබද්ධ කොට පාලනය කිරීම
● රට පළාත් පහකට බෙදා පාලනය කිරීම (ල. 03)

(ii)
ගොවිජනතාවට අඩු පොළියට ණය ලබාදීම
ණයබර අඩුකොට ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම
රටේ ගොවිජනතාවගේ ශුභ සාධන ඉහළ නැංවීම
සමුපකාර ව්‍යාපාරයේ ශක්තිමත් කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම (ල. 04)

(iii) A හෙන්රි වෝඩ් ආණ්ඩුකාරයා B හර්කියුලස් රොබින්සන්
C විලියම් ග්‍රෙගරි D ආතර් ගෝඩින් ආණ්ඩුකාරවරයා (ල. 04)

05. (i) ★ ලන්ඩන් මිෂනාරි සංවිධානය ★ චර්ච් මිෂනාරි සංවිධානය
★ බැප්ටිස්ට් මිෂනාරි සංවිධානය මෙයින් 03 ක් ලිවීමට (ල. 03)

(ii)
● ලේඛනය
● දේශනය
● සමාජසේවා
● අධ්‍යාපනය (ල. 04)

(iii) (අ) පරම විඥානාර්ථ (ආ) විදෙ‍්‍යාදය (ඇ) ස්කන්ධ පුරාණම් (ඈ) ඔරබි පාෂා (ල. 04)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

06. (i) A - පෘතුගීසි
B - ලන්දේසි
C - ප්‍රංශ (ල. 03)

(ii) A - බාබූර්
B - මහා අක්බාර්
C - සාජහාන්
D - ඖරංෂෙබ් (ල. 04)

(iii) (1) උපකාරක ගිවිසුම් ක්‍රමය (2) හයිද්‍රාබාද් / මයිසූර් (3) හිමිකරුවකු නැති ප්‍රදේශ පවරාගැනීම
(4) ජායිපූර් / නාග්පූර් (ල. 04)

07. (i) C (ii) A (iii) B (ල. 03)

(ii)
- ★ ව්‍යවස්ථාදායක සභාව පුළුල් කොට එහි බලතල වැඩි කිරීම
- ★ විධායක සභා නියෝජනයට ඉන්දියානුවන්ට අවස්ථාව දීම
- ★ සිවිල් සේවයට ඇතුළු කර ගන්නා ඉන්දියානුවන් පිරිස වැඩි කිරීම
- ★ සිවිල් සේවයට බඳවා ගැනීමේ විභාග බ්‍රිතාන්‍ය තුළ පමණක් නොව ඉන්දියාව තුළින් පැවැත්වීම
- ★ යුද්ධ හමුදා කටයුතු සඳහා රජය දරන වියදම අඩු කිරිම (ල. 04)

(iii) බලධාරින්ට පෙත්සම් ඉදිරිපත් කරීම
ඔවුන් සමඟ සාකච්ඡා කිරීම
රැස්වීම් පැවැත්වීම
ලේඛන මාධ්‍ය යොදාගෙන තම කටයුතු වලට ප්‍රචාරණය ලබාදීම (ල. 04)